ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ஊக்கு பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான இலங்கை முகவராண்மை

Sri Lanka Anti Doping Agency

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

கிராமிய மற்றும் பாடசாலை விளையாட்டு உட்கட்டமைப்பு மேம்பாட்டு இராஜாங்க அமைச்சு

State Ministry of Rural and School Sports Infrastructure Improvement

2020

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT



/antidopingagency

/SLAntiDoping

slantidoping.org

Sri Lanka Anti-Doping Agency

Sri Lanka Anti-Doping Agency
363/12,Sugathadasa Stadium(Block D),
Stadium Parking Road,
Sirimavo Bandaranaike Mawatha,Colombo 14

Inspiring
True
Sport

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වාර්ෂික වාර්තාව
2020

සිංහල

දැක්ම

නිවැරදි හා සාධාරණ ජයග්‍රහණයක්
උදෙසා තහනම් ද්‍රව්‍යවලින් තොර
ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්

මෙහෙවර

ලෝක මත්ද්‍රව්‍ය නිවාරණ පනත සහ
එහි රෙගුලාසිවලට අනුකූල වන
ආකාරයට **2013** අංක **33** දරන ක්‍රීඩාවල
යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට
එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීම





සභාපතිතුමාගේ පණිවුඩය

2020 වර්ෂය ලෝකවාසී සියලු දෙනාට ම ජාති, පාට, කුල භේදයකින් තොර ව එක සේ අභියෝගාත්මක වසරක් විය. කොවිඩ් 19 වසංගත තත්ත්වය ඉතා ශීඝ්‍රයෙන් ලොව පුරා පැතිර ගිය අතර ලෝකයේ සියලු රාජ්‍යයන්හි ආර්ථිකයට එය මරු පහරක් විය. නමුත් කෙතරම් බාධක පැමිණිය ද ඒවා සියල්ල පරදවා හැම විට ම අප සතු යුතුකම් හා වගකීම් ඒ ආකාරයට ම ඉටු කිරීමට රාජ්‍ය සේවකයන් වශයෙන් අපි බැඳී සිටින්නෙමු.

ශ්‍රී ලාංකික ක්‍රීඩා ක්ෂේත්‍රයේ තහනම් උත්තේජක භාවිතය මුලිනුපුටා දැමීම යන උතුම් කර්තව්‍ය පෙරදැරි කරගෙන ක්‍රියාත්මක වන අප ආයතනය කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුව ද තමන්ට පැවරුණු කාර්යය ඒ ආකාරයෙන් ම ඉටු කිරීමට ඇප කැප විය. පිරිසිදු, සාධාරණ හා අව්‍යාජ ක්‍රීඩාවක් බිහි කිරීම වෙනුවෙන් තිරසර චාරිකාවක යෙදෙන මෙම ආයතනය තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම, උත්තේජක භාවිතයෙන් ලැබෙන අනිටු ප්‍රතිඵල පිළිබඳ ක්‍රීඩකයන් දැනුවත් කිරීම හා තහනම් උත්තේජක සම්බන්ධ විද්‍යාත්මක පරීක්ෂණ පැවැත්වීම ආදී කාර්යයන් තුළින් සිය මෙහෙවර ශ්‍රී ලංකාවාසී ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබයි.

සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම උපයෝගී කරගනිමින් පෙර වසරවල පමණටම නොවුණ ද මෙම වසරේදීත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උත්තේජක පරීක්ෂණ ක්‍රියාවලි අපි ඒ ආකාරයෙන් ම ඉටු කළෙමු. වසංගත තත්ත්වය හමුවේ ක්‍රීඩා තරගාවලි නොපැවැත්වූ හෙයින් තරගාවලියෙන් බැහැර මූත්‍රා සම්පල් පරීක්ෂණ ඉතා වැඩි වශයෙන් සිදු කිරීමට අප මෙම වසරේ දී නැඹුරු වූයෙමු.

මෙම අභියෝගාත්මක වසර තුළ දී ද ක්‍රීඩාවේ ජීව ගුණය රැක ගැනීම උදෙසා ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා සිදු කිරීමට හැකි වීම අප ලත් භාග්‍යයකි. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ක්‍රීඩකයන් අතරට ගොස් ඔවුන් දැනුවත් කිරීම සෞඛ්‍ය ආරක්ෂිත නොවීම හේතුවෙන් අප ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ ද සහයෝගය ඇති ව මෙම ක්‍රියාමාර්ගය අනුගමනය කළෙමු. මෙමගින් යම් ආකාරයකට හෝ ක්‍රීඩක ප්‍රජාව උත්තේජක මර්දනය පිළිබඳ දැනුවත්වීමක් සිදු වූ බවට අප විශ්වාස කරන අතර ඉදිරියේදීත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය යොදාගෙන උත්තේජක භාවිතය මුලිනුපුටා දැමීම සම්බන්ධ විවෘත සංවාද හා සාකච්ඡා පැවැත්වීමට අප සැලසුම් කරන්නෙමු.

මීට අමතර ව 2020 වසර ආරම්භයේ දී ම විවිධ ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් දිනෙන් දින කල් යමින් තිබූ උත්තේජක මර්දන රීති මාලාව නියමාකාරයෙන් භාෂා ත්‍රිත්වයෙන් ම පරිවර්තනය කර රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමට ලැබීම අප ලත් ජයග්‍රහණයකි. තව ද කළමනාකරණ මණ්ඩලයේ මාර්ගගත (Online) රැස්වීම් පැවැත්වීම මෙන් ම ආයතනික නිලධාරීන් Zoom තාක්ෂණය ඔස්සේ උත්තේජක මර්දන වැඩසටහන්වලට (Webinar) සහභාගී වීම, තාක්ෂණික වශයෙන් අප ආයතනය තැබූ ඉදිරි පියවරකි.

එසේම, හිටපු සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ දිස්ත්‍රික් ක්‍රීඩා වෛද්‍ය නිලධාරීන් (MOIC) හට උත්තේජක මර්දනය පිළිබඳ දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් පැවැත්වීමට හැකි වූ අතර එහිදී දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා විෂය භාර වෛද්‍යවරුන්ගේ සහයෝගය තහනම් උත්තේජක මුලිනුපුටා දැමීමේ කාර්යය සඳහා ලබා ගැනීමට හැකි වීම විශාල භාග්‍යයකි.

මෙලෙස ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මුඛ්‍ය අරමුණ වන ක්‍රීඩාවේ දී භාවිතා නොකළ යුතු යැයි නියම වූ තහනම් ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම තේමා කොටගෙන 2020 වසර පුරාවට සුපුරුදු ලෙස ක්‍රමවත් වූත්

අර්ථාන්විත වූත් සාර්ථක ගමනක යෙදුණි. ඒ සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ විවිධ පාර්ශවයන් වෙනුවෙන් මාගේ සුභාශිංෂණය පිරි නමමි.

එමෙන් ම 2021 වසරේදී ද අප ආයතනය සතු ව විශේෂ සැලසුම් කීපයක්ම දියත් කිරීමට නියමිත අතර ඒ අතරින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතු ව දැනටමත් ඉදි කිරීම අවසන් කර ඇති රසායනාගාර පර්යේෂණ ඒකකය විවෘත කිරීමට නියමිත වේ. මෙම පර්යේෂණ ඒකකය හරහා සුවිශාල මෙහෙවරක් ලාංකේය ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් සිදු කළ හැකි බව අපගේ විශ්වාසය යි. ඒ අනුව ලබන 2021 වසරේ දී අප ආයතනයේ කාර්යභාරයන් තවදුරටත් පුළුල් කිරීම හා එමගින් ආයතනික අභිප්‍රායයන් සර්වප්‍රකාරයෙන් ම සාර්ථක කර ගැනීමට සියලු ශක්තිය, ධෛර්යය හා වාසනාව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති



අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

අව්‍යාජ ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීමෙහිලා දැවැන්ත කර්තව්‍යයක් ඉටුකරනු ලබන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය බිහිවී වසර හතක් සම්පූර්ණ විය. මෙම ගත වූ වසර හත තුළ තහනම් ද්‍රව්‍ය හා ක්‍රමවලින් තොර ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක් ඇති කිරීමේලා අංශ ගණනාවක් ඔස්සේ සිය මෙහෙවර දියත් කිරීමට දායක වුණි. ලොව පුරා පැතිරී ගිය නව කොරෝනා වසංගත රෝග ව්‍යාප්තිය මගින් සමස්ත ලෝකයේ ම ක්‍රීඩා ක්ෂේත්‍රය යම් පසුබෑමකට ලක් වූව ද පැවති අවස්ථා හා ඉඩකඩ ප්‍රයෝජනයට ගෙන අව්‍යාජ ක්‍රීඩකයා ආරක්ෂා කිරීම පිණිස තහනම් උත්තේජක පරීක්ෂණ හා දැනුවත් කිරීම් සිදු කිරීමට අප ආයතනය විසින් කටයුතු සැලසිණි. 2020 වසරේ පැවැත්වීමට නියමිත ව තිබූ ඔලිම්පික් තරගාවලිය පවා නොපැවැත්වීමට හේතු වූයේ මෙම කොවිඩ් 19 ගෝලීය වසංගතය, මහත් අහිතකර ලෙස බලපෑම යි.

සුපුරුදු ලෙස 2020 වසර පුරා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මූත්‍රා සාම්පල යොදා ගනිමින් සිදු කරන ලද තහනම් උත්තේජක පරීක්ෂණ ගණන 106කි. මෙම පරීක්ෂණයන් ක්‍රීඩාවේ දී (In Competition) හා ක්‍රීඩාවෙන් පිටත (Out of Competition) මූත්‍රා නියැදි ලබාගෙන සිදු කිරීමට කටයුතු කරන ලදි.

ගෝලීය වසංගත තත්වය අතරතුර ද ලද අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම හා පිටුදැකීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 23ක් පැවැත් වූ අතර ඒ සඳහා සහභාගි වූවන් සංඛ්‍යාව 965ක් විය. එම දැනුවත්කිරීම්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන්, ඔවුන්ගේ දෙමාපියන්, පුහුණුකරුවන්, ක්‍රීඩාවට උනන්දුවක් දක්වන පාර්ශව හා විශේෂයෙන් තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සිදුකෙරිණි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ස්ථාපනය කරනු ලබන නවීන විද්‍යාත්මක පර්යේෂණාගාරයේ ඉදිකිරීම් ද අඛණ්ඩ ව 2020 වසර පුරා සිදු කරනු ලැබිණි. මෙම පර්යේෂණාගාරය තුළ අති නවීන උපකරණ අන්තර්ගත වන අතර Liquid Chromatography, Triple Quadrupole Mass Spectrophotometer (LC/MS/MS) යන්ත්‍රයකින් ද සමන්විත වේ. එලෙස ගත් කළ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ඉදි කර ඇති මෙම පර්යේෂණාගාරය අප ජීවත් වන දකුණු ආසියානු කලාපයේ පවතින අති නවීන පර්යේෂණාගාරයක් බව පවසනුයේ ඉමහත් අභිමානයෙනි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් පසුගිය වසරේ ඕස්ට්‍රේලියානු සහයෝගය ඇති ව තහනම් උත්තේජක භාවිතය පිටුදැකීම සඳහා බුද්ධි තොරතුරු රැස් කිරීම පිළිබඳ මූලික දැනුවත්භාවයක් ද ලබා ගන්නා ලදි. 2021 වර්ෂයේ දී මෙවැනි බුද්ධි ඒකකයක් අප ආයතනයේ ද ඇති කිරීමට මූලික අඩිතාලම දැමීම අපගේ අපේක්ෂාව යි. තව ද දැනුවත් කිරීමේ වැඩසටහන් ගම් මට්ටමට ගෙන ගොස් පැවැත්වීමට කටයුතු සිදු කිරීමට නියමිත අතර, එහිදී ග්‍රාමීය ප්‍රදේශවල සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දැනුම යාවත්කාලීන කරලීමට හැකි වනු ඇත.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීමේ දී “Smart Testing” සංකල්පය භාවිතා කිරීමට කටයුතු කරයි. එහිදී පරීක්ෂණ සඳහා යොදාගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන් මනාකොට සුපරීක්ෂණය කිරීමට අපට හැකිවනු ඇත. වර්තමානයේ බෙහෙවින් ප්‍රචලිත ව ඇති සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ ද මෙම දැනුවත් කිරීම් සිදු කිරීමට අපි යොමුවී සිටිමු. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සකස් කළ තහනම් ද්‍රව්‍ය හඳුනාගැනීමේ ඇන්ඩ්‍රොයිඩ

යෙදුම (DR App) භාවිතා කිරීම සඳහා ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන් යොමු කරවීම අපගේ අපේක්ෂාව යි.

2021 නව වසර මුල දී අපගේ පර්යේෂණාගාරය විවෘත කර නවීන රසායනාගාර පර්යේෂණ සිදු කිරීම ආරම්භ වනු ඇත. පසුගිය 2020 වසර තුළ දී අප ආයතනයේ අභිවෘද්ධිය සඳහා දායක වූ සියලු දෙනාට ම කෘතවේදිත්වය පළ කරන අතර වර්තමානයේදීත් හා අනාගතයේදීත් ශ්‍රී ලාංකාවේ අව්‍යාජ ක්‍රීඩාවට මහත් වූ සේවයක් සිදු කිරීමට හැකිවේවා යැයි සුභාශිංෂණය කරමි.

වෛද්‍ය සීවලී ජයවික්‍රම,

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වත්මන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ස්ථානය හිමි වන්නේ සහජ හැකියාවෙන් පිරිපුන් පිරිසිදු ක්‍රීඩාවක් සඳහා ය. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ පවතින තහනම් උත්තේජක භාවිතය පිටුදැකීම හා ඒ පිළිබඳ ව දැනුවත් කිරීම සම්බන්ධයෙන් පවතින එක ම හා ප්‍රධානතම ආයතනය වනුයේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය යි.

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත ප්‍රකාරව මෙම ආයතනය පිහිටුවා ඇත. දැනට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ ක්‍රීඩික ක්‍රීඩිකාවන් ක්‍රීඩාවේ දී භාවිතා නොකළ යුතු තහනම් උත්තේජක මුලිනුපුටා දැමීම හා යහපත් පිරිසිදු භාවයෙන් යුතු ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීම යි. අන්තර්ජාතික ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක ද්‍රව්‍ය පිටුදැකීම වෙනුවෙන් කටයුතු කරන ජාත්‍යන්තර ආයතන සමඟ ද එක් ව සහයෝගී ව කටයුතු කරයි.

අරමුණු

පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව නියෝජ්‍යායතනයේ පරමාර්ථ විය යුත්තේ :-

(අ) ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීම.

(ආ) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම පිළිබඳ ක්ෂේත්‍ර හා අදාළ පර්යේෂණ හා නියෝජ්‍යායතනය හා සමාන කර්තව්‍ය ඉටුකරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යෝන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සිය අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් සේවාවන් සැපයීම සිදුකරනු ලබයි.

1. ජාතික, අන්තර්ජාතික හා පාසල් මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උත්තේජක පරීක්ෂණ සිදුකිරීම.

2. තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතා කර ඇති බවට සනාථ වූ ක්‍රීඩකයින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම.

3. තහනම් ද්‍රව්‍ය භාවිතය හා එහි අනිටු විපාක පිළිබඳ ක්‍රීඩකයින්, පුහුණුකරුවන්, පාසල් සිසුන්, දෙමාපියන් හා අනෙකුත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් දැනුවත් කිරීම.

4. ක්‍රීඩාවේ දී භාවිතා වන තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම, එහි අනිටු විපාක හා තහනම් ද්‍රව්‍ය පරීක්ෂණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් යුනෙස්කෝ ආයතනයේ අරමුදල් සහිත ව දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමින් සිදු කිරීම.

5. ක්‍රීඩාවේ යෙදීමේ දී තහනම් ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ව පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා විෂය මාලාවට මෙම අංගය එක් කිරීමට කටයුතු සම්පාදනය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය



මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති



මහාචාර්ය ලාල් ජයකොඩි
සාමාජික



මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු
සාමාජික



ඩබ්.ඒ.කුලසූරිය මහතා
සාමාජික



ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය මහතා
සාමාජික



වෛද්‍ය ලාල් ඒකනායක මහතා
සාමාජික



සජීත් ජයලාල් මහතා
සාමාජික



එස්.අයි.එම්.රෝසා මහතා
සාමාජික



වෛද්‍ය අන්වර් හම්ඩානි
සාමාජික



වෛද්‍ය නිහාල් මුණසිංහ මහතා
සාමාජික

වත්මන් කාර්ය මණ්ඩලය



වෛද්‍ය සීවලී ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්



වෛද්‍ය එස්.පී.පී. ද අල්විස්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)



ජේ.එම්.ජේ.ජේ.ජයසුන්දර
මාණ්ඩලික ලේකම් හා නීති නිලධාරී



එච්.එම්.සී.ජී.දයාරත්න
ගණකාධිකාරී



පී.එන්.ජේ.ප්‍රනාන්දු
පර්යේෂණ නිලධාරී



ඒ.එස්.ඩී.පිගේරා
පර්යේෂණ නිලධාරී



එස්.ඒ.එන්.රෂානි
පර්යේෂණ නිලධාරී



ජී.එන්.එස්.ප්‍රනාන්දු
පරිපාලන නිලධාරී



වයි.ඒ.යූ.මෙධාවී
තොරතුරු තාක්ෂණ නිලධාරී



කේ.ආර්.කණගසභාපති
භාෂා පරිවර්තක



ඩී.කේ.ජේ.චතුරිකා
සංවර්ධන නිලධාරී



එම්.ජී.ටී.ඩී.සේනාරත්න
කළමනාකරණ සහකාර



එම්.ජී.එස්.අයි.කරුණාතිලක
කළමනාකරණ සහකාර



එන්.ජී.එස්.එච්.විජේරත්න
කළමනාකරණ සහකාර



ඒ.ජී.පී.ඩී.තිලකරත්න
කළමනාකරණ සහකාර



ඒ.ජී.එල්.කේ.එස්.ගුණවර්ධන
කාර්යාල කාර්ය සහයක



එම්.ඩී.ආර්.ඩී.ජයවීර
කාර්යාල කාර්ය සහයක



ඒ.අයි.ආර්.සේනාරත්න
රියදුරු



කේ.එම්.එල්.වැවේතැන්න
රියදුරු



කේ.පී.සී.ප්‍රේමරත්න
රියදුරු

සංවිධාන ව්‍යූහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ
කළමනාකරණ සහකාර
පර්යේෂණ නිලධාරි(03)
ගණකාධිකාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සහකාර
තොරතුරු තාක්ෂණ නිලධාරි
සංවර්ධන නිලධාරි
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරි (01)
තාක්ෂණ සහකාර (01)
කළමනාකරණ සහකාර
රියදුරු (04)
කාර්යාල කාර්ය සහායක
නීති නිලධාරි/මාණ්ඩලික ලේකම්
අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම)
සහකාර අධ්‍යක්ෂ
කළමනාකරණ සහකාර
HM
MM 1.1
AR-1
JM
MA-4
MA-3
MA1-1
MA 2-1
PL-3
PL-1

කාර්ය මණ්ඩල තොරතුරු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත 28 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත.

	තනතුරු නාමය	වැටුප් තලය	තනතුරු සංඛ්‍යාව	වර්තමාන සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
01.	අධ්‍යක්ෂ ජනරාල්	HM 2-1	1	1	
02.	අධ්‍යක්ෂ	HM 1-1	2		2
03.	සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ	MM 1-1	2		2
04.	ගණකාධිකාරි	MM 1-1	1	1	
05.	නීති නිලධාරි/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	MM 1-1	1	1	
06.	පර්යේෂණ නිලධාරි	AR 1	3	3	
07.	පරිපාලන නිලධාරි	JM 1-1	1	1	
08.	තොරතුරු තාක්ෂණ නිලධාරි	JM 1-1	1	1	
09.	භාෂා පරිවර්තක	MA-4	1	1	
10.	සංවර්ධන නිලධාරි	MA 3	3	1	2
11.	කළමනාකරණ සහකාර	MA 1-1	4	4	
12.	තාක්ෂණ සහකාර	MA 2-1	1		1
13.	රියදුරු	PL 3	4	3	1
14.	කාර්යාල කාර්ය සහයක	PL 1	3	2	1
එකතුව			**28**	**19**	**9**

තහනම් උත්තේජක පරීක්ෂණ

පිරිසිදු ක්‍රීඩාවක් බිහිකිරීමත් පිරිසිදු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ආරක්ෂා කිරීමත් අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් **2020** වසර තුළ සිදු කළ තහනම් උත්තේජක පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ .

අංකය	ක්‍රීඩාව	තහනම් උත්තේජක පරීක්ෂණ ගණන	තහනම් උත්තේජක ලබාගත් බවට සනාථ වූ අවස්ථා
1.	රග්බි	20	01
2.	මළල ක්‍රීඩා	54	-
3.	පාපැදි	06	01
4.	බර ඉසිලීම	04	-
5.	බොක්සිං	03	-
6.	ක්‍රිකට්	08	-
7.	සවි එසවීම	03	-
8.	පැරා මළල ක්‍රීඩා	08	-
	එකතුව	**106**	**02**

ක්‍රීඩා අනුව තහනම් උත්තේජක පරීක්ෂණ පැවැත්වීම- 2020

මානව තහනම් උත්තේජක පරීක්ෂණ- මූත්‍රා



දැනුවත් කිරීමේ වැඩසටහන්

2020 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා සිදු කළ තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පහත සඳහන් පරිදි වේ.

දිනය	ස්ථානය	කා සඳහා ද	සහභාගීත්වය
09.01.2020	කැන්ඩි ක්‍රීඩා සමාජය නිත්තේවෙල	රග්බි ක්‍රීඩකයින්	32
10.01.2020	ක්‍රීඩා වෛද්‍ය ආයතනය	මළල ක්‍රීඩා කනිෂ්ඨ සංචිතය	55
07.02.2020	සබරගමුව විශ්ව විද්‍යාලය	සබරගමුව විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්	131
11.02.2020	ශ්‍රී ල. උ. ම. නි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව	බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩකයින්	8
13.02.2020	ශ්‍රී ල. උ. ම. නි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව	ජාතික දැල්පන්දු කණ්ඩායම	20
14.02.2020	ශ්‍රී ල. උ. ම. නි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව	සම්බාහකයින්	60
08.06.2020	මර්ගගත දේශන	කොළඹ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්	25
08.07.2020	ක්‍රීඩක නේවාසිකාගාරය - ටොරින්ටන්	බර ඉසිලීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්	6
15.07.2020	ක්‍රීඩක නේවාසිකාගාරය - ටොරින්ටන්	වූෂු ක්‍රීඩකයින්	10
22.07.2020	ක්‍රීඩක නේවාසිකාගාරය - ටොරින්ටන්	වූෂු ක්‍රීඩකයින්	8
04.08.2020	කෙත්තාරාම ක්‍රීඩාංගණය	ක්‍රිකට් ක්‍රීඩකයින්	27
06.08.2020	කෙත්තාරාම ක්‍රීඩාංගණය	ක්‍රිකට් ක්‍රීඩකයින්	6
13.08.2020	ශ්‍රී ල. උ. ම. නි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව	වෛද්‍ය ශිෂ්‍යයින් - කොළඹ වෛද්‍ය පීඨය	7
19.08.2020	ගුවන් හමුදා කඳවුර	ගුවන් හමුදා ක්‍රීඩා ඒකකය	168
26.08.2020	ශ්‍රී ල. උ. ම. නි. ශ්‍රවණාගාරය	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්‍රීඩා වෛද්‍ය නිලධාරීන්	18
04.09.2020.	ක්‍රීඩා වෛද්‍ය ආයතනය	මළල ක්‍රීඩා 2020 Elite සංචිතය	13
16.09.2020	ක්‍රීඩා වෛද්‍ය ආයතනය	භෞතචිකිත්සකයින්	5
24.09.2020	හොකී ටර්ෆ් ගෘහස්ත ක්‍රීඩාංගණය	මළල ක්‍රීඩා පුහුණුකරුවන්	16
28.09.2020	ක්‍රීඩා වෛද්‍ය ආයතනය	යුධ හමුදා මළල ක්‍රීඩා දිගුදුර ධාවන ක්‍රීඩකයින්	11
03.10.2020	ශ්‍රී ල. උ. ම. නි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව	ක්‍රීඩා වෛද්‍ය ඩිප්ලෝමාධාරීන්	13
14.11.2020	මර්ගගත දේශන	පෝෂණ සංගමය	240
20.11.2020	මර්ගගත දේශන	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්	46
25,26,27සහ 28.12.2020	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී ක්‍රීඩාංගණය	98 වන මළල ක්‍රීඩා ජාතික ශූරතාවලියෙහි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා Out Reach වැඩමුළුවක් පැවැත්වීම	40
	එකතුව	23	965



බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩකයින්



සබරගමුව විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්



කැන්ඩි ක්‍රීඩා සමාජය නිත්තේවෙල රග්බි ක්‍රීඩකයින්



මළල ක්‍රීඩා කනිෂ්ඨ සංචිතය

පර්යේෂණ අංශය

1) ආහාරමය අතිරේක භාවිතය නිසා ශ්‍රී ලාංකික ක්‍රීඩකයින්ට ඇතිවන සෞඛ්‍යමය බලපෑම පිළිබඳ කළ පර්යේෂණයේ සොයා ගැනීම්, ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ සංගමය විසින් පවත්වන ලද 133 වැනි වාර්ෂික ජාත්‍යන්තර වෛද්‍ය සමුළුවේ දී ප්‍රකාශයට පත් කිරීම.
2) නිමාවට පත් කරන ලද අරිෂ්ටවල තහනම් උත්තේජක තිබේදැයි සෙවීමට හා ශ්‍රී ලංකාවේ ජාතික තලයේ ක්‍රීඩකයින්ගේ ආහාරමය අතිරේක භාවිතය හා ඒ පිළිබඳ දැනුම සෙවීමට කළ පර්යේෂණ ව්‍යාපෘති දෙකෙහි පූර්ණ පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් කිරීමට ජර්නල වෙත යොමු කිරීම.
3) ශ්‍රී ලංකාවේ උත්තේජක මර්දන නීති කඩකිරීම්, උත්තේජක පරීක්ෂා කිරීම්වලට යොදා ගත හැකි ජෛව සාම්පල හඳුනාගැනීම හා ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල ක්‍රීඩකයින්ගේ පෝෂණ මට්ටම, ආහාර අතිරේක භාවිතය යන විෂය ක්ෂේත්‍ර තුන ඔස්සේ නව පර්යේෂණ තුනක් ආරම්භ කිරීම.
4) උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ඇති පර්යේෂණ විද්‍යාගාරය පිහිටුවීමට අවශ්‍ය වන මූලික පර්යේෂණාගාර උපකරණ හා ද්‍රව ස්කන්ධ වර්ණාවලීක්ෂය යන අධිතාක්ෂණික උපකරණයේ මිලදී ගැනීම් හා පර්යේෂණාගාරය තුළ ඒවා ස්ථාපනය කිරීමේ කටයුතු අවසාන කිරීම.



තොරතුරු තාක්ෂණ අංශය

1. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන් සිටින ස්ථානය දුරකථනයෙන් යාවත්කාලීන කිරීමට ADAMS සඳහා සහාය ලබා දීම.
2. සතිපතා යාවත්කාලීන තොරතුරු වාර්තා සකස් කර අමාත්‍යාංශය වෙත යැවීම.
3. චක්‍රලේඛයට අනුව සන්නිවේදනය හා වැඩ කිරීම සඳහා කාර්ය මණ්ඩලය එකට සම්බන්ධ කිරීමට අවශ්‍ය මෘදුකාංග භාවිතා කිරීමට මඟ පෙන්වීම.
4. “DR app” යෙදුම පිළිබඳ ලිපියක් ලිවීම සහ ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ සඟරාවෙහි පළ කිරීම .ජාතික ඔලිම්පික් කමිටුවේ “Good Sport Bulletin Issue - XII” Drug Reference app පිළිබඳ ලිපිය.



Monday 04th May 2020 ISSUE - 12

GoodSport NEWS

SRI LANKA OLYMPIC WEEKLY NEWS BULLETIN

Sitting by the Shore till the Surfers are Back

"Surfing is going through difficult times..." – Hiran

There's a world of sun and sand
Full of sky and far from land
Where evening breezes caress the shore
Like a gentle comforting hand
Fragrant blossoms, honey bees
Careless laughter upon the breeze
And lovers fading to pools of deep
Purple shadows among the trees

When I was a wee lad I used to listen to this song sung by the Danish -Dutch singing duo Nina and Frederick and get teleported to a little corner of the world of my own. Now as a grey bearded scribe I experienced the same when I perambulated long the Arugam Bay Beach as a part of the Sri Lanka Olympic Media team last year while covering the "SO Sri Lanka Pro" World Surf League Men's QS3000. Though the mornings were full of buzz and hustle-bustle fading skies had magic in it. Yet, for us it was the morning session that was important officially.

Continued on Page 07

Frame Stamps from Hashima City

Hashima City, the Host Town of Sri Lanka for Tokyo Olympic and Paralympic Games 2020, has created 'Host Town Frame' Stamps as a part of the 'Host Town' project.

Hashima City has already made various efforts such as dispatching athletic instructors and supporting sports goods for athletes.

Continued on Page 03

SLADA Develops Drug Reference App

Drug Reference App developed by Sri Lanka Anti Doping Agency (SLADA) including prohibited status of medicines in Sri Lanka, for athletes and doctors, available for Android Devices with free of charge. Problem — Sri Lanka Anti-Doping Agency body for dealing related matters in Sports in Sri Lanka.

Continued on Page 03



Monday 04th May 2020 3

NOC NEWS

From Page 01

Considering our main objective, they have identified the main issue which is the lack of information regarding prohibited substances. Annually, World Anti-Doping Agency (WADA) declares a list of prohibited substances in sports. That list contains the names of each chemical compound, ex: the generic name of medicines, making it a more a technical document. The WADA Prohibited List includes some substances which might cause unintentional doping for athletes as doctors are prescribing them for actual diseases.

Purpose:
To assist athletes to check the status of their medication purchased in Sri Lanka, as a part of promoting clean and fair sport in the country before this becomes a social menace.

Solution:
Mobile App in this digital world has a pivotal role, we have mostly developed an Android mobile App calling DR App (Drug Reference App), containing all the relevant details on prohibited status of all registered medicines in Sri Lanka and there is an official website for this app.

App Features:
- Check for prohibited status of brands and ingredients. Illustrated using three colours as traffic light system and easy to recognise prohibited status at one time look).
- Simple display of prohibited status distinguishing "out of competition" and "in competition"
- Details on sports-specific characteristics
- Details concerning different routes of administration
- Information upon WADA substance classifications
- PDF download with search details or send as email to own e-mail.
- Save Searched items into the Quick search list.
- Guidance activity for first time users and User Manual inclucies
- Quick Search

Benefits:
- Provides athletes and support personnel with information about the prohibited status of specific medicines based on the current WADA Prohibited List.
- Easy tracking
- Save search details for further reference
- Share information on prohibited status with others using any sharing method
- Doctors can see the prohibited status of the medicines before issuing for an athlete
- This App helps you keep up with the latest status and current status

Product Availability: Available on Google Play Store App

For more information on: http://slantidoping.org/dop.html

STOP THE SPREAD

A message from National Olympic Committee of Sri Lanka and Rotary International:

Sri Lanka's Badminton Golden star Thilini Hendahewa who won a Gold Medal in Badminton – Women's Doubles at the South Asian Games - Nepal 2019 brings this message to you!

5. කටාර් විද්‍යාගාරයට අවසන් වරට ඉදිරිපත් කරන ලද සාම්පලවල පරීක්ෂණ ප්‍රතිපල සඳහා ADAMS පරීක්ෂා කිරීම .
6. අවස්ථානුකූල ව අවශ්‍ය ආයතනික වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම.
7. කාර්ය මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය විට Jitsi රැස්වීම් යෙදුම භරහා රැස්වීම් සංවිධානය කිරීම.

8. SLADA සඳහා නව ක්‍රමවේදය පිළිබඳ යෝජනාවක් සකස් කිරීම -Anti-Doping Education- The Athlete Learning Gateway on Anti-Doping (ALG on Anti-Doping).

9. SLADA කාර්ය මණ්ඩලය සඳහා Covid-19 වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා Adobe Illustrator භාවිතා කරමින් නිර්මාණ සකස් කිරීම.

10. SLADA සඳහා යූ ටියුබ් නාලිකාව සකස් කර වීඩියෝ උඩුගත කිරීම.

11. ආයතනයේ ප්‍රධාන වෙබ් අඩවිය තොරතුරුවලින් යාවත්කාලීන කිරීම.



නීති අංශය

1. 2019 අගභාගයේ හා 2020 වර්ෂය තුළ උත්තේජක ද්‍රව්‍ය ලබා ගැනීම සම්බන්ධයෙන් වාර්තා වූ සියලුම ක්‍රීඩකයන්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වීම සහ ඒවායේ අවසන් තීරණ ප්‍රකාශයට පත් කිරීම.

2. අභියාචනා පරීක්ෂණයන්හි පැහැදිලි අවසන් තීන්දු ලබාදීම සඳහා විමසීම් වට 3ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පැවැත්වීම. එකී සෑම අවස්ථාවක දී ම වාචික හා ලිඛිත දේශන සිදු කිරීම හා අවශ්‍ය නීතීඥ සහයෝගය ලබා ගැනීම සඳහා කටයුතු සංවිධානය කරදීම.

3. උත්තේජක මර්දන රීති සඳහා නීතිපතිගේ අනුමැතිය ලබා ගැනීම හා එය නිසි පරිදි භාෂා ත්‍රිත්වයෙන් ම රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම.

4. 2021 වර්ෂය සඳහා අලුත් වන උත්තේජක මර්දන රීති හා සම්බන්ධ "Webinar" කීපයකට ම සහභාගී වීම.

5. ප්‍රථම වරට ක්‍රීඩකයෙකු ලබා දුන් තොරතුරක් සම්බන්ධයෙන් පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හා එක් ව විශේෂ විමර්ශනයක් පැවැත්වීම.

6. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා මාර්ගගත තාක්ෂණය හඳුන්වාදීම මගින් සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැර ව නව මුහුණුවරකින් රැස්වීම් පැවැත්වීම.

2021 වර්ෂයට අදාළ ඉලක්ක හා අරමුණු

1. CBL සමාගම සමඟ පවතින අවබෝධතා ගිවිසුමෙහි කාලය දීර්ඝ කිරීම හා ගිවිසුම ප්‍රකාරව සිදු කරන ක්‍රියාකරකම්වල නව වෙනස්කම් කීපයක් සිදු කිරීම.
2. 2021 වර්ෂයේ නිකුත් වූ නව උත්තේජක මර්දන නීති හා රීතීන් පිළිබඳ ව විනය හා අභියාචනා මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීම.
3. ගරු විෂය භාර අමාත්‍යතුමාගේ නම් කිරීමෙන් අභියාචනා කමිටුවට නව සාමාජිකයන් තිදෙනෙකු පත් කිරීම.
4. විමර්ශන ඒකකයක් පිහිටුවීම හා ඒ හරහා උත්තේජක මර්දන නීති කඩකිරීම් සම්බන්ධ ව විමර්ශන පැවැත්වීම.
5. 2021 වර්ෂයේ සිට හඳුන්වාදුන් නව උත්තේජක මර්දන රීතීන් නිසියාකාරයෙන් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව හරහා පරිවර්තනය කර භාෂා ත්‍රිත්වයෙන් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම.
6. 2020 වර්ෂයේ දී ආරම්භ කළ නව පර්යේෂණ තුන අවසාන කර ප්‍රකාශයට පත් කිරීම.
7. අරිෂ්ටවල තහනම් උත්තේජක තිබේදැයි සෙවීමට හා ශ්‍රී ලංකාවේ ජාතික තලයේ ක්‍රීඩකයින්ගේ ආහාරමය අතිරේක භාවිතය හා ඒ පිළිබඳ දැනුම සෙවීමට කළ පර්යේෂණ ව්‍යාපෘති දෙකෙහි පූර්ණ පර්යේෂණ වාර්තා ජර්නලවල ප්‍රකාශයට පත් කිරීම.
8. උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ඇති පර්යේෂණ විද්‍යාගාරය තුළ තහනම් උත්තේජක පිළිබඳ පර්යේෂණ ආරම්භ කිරීම.
9. පර්යේෂණාගාරයට මිල දී ගත් ද්‍රව-ස්කන්ධ වර්ණාවලීමානයේ කාර්ය සාධන පරීක්ෂණය හා පුහුණු කටයුතු අවසාන කිරීම.
10. රාජ්‍ය විශ්වවිද්‍යාල ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතනවලට ද මෙම විද්‍යාගාරය භාවිතා කිරීමට අවකාශ සලසාදීමෙන් ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ අවකාශය පුළුල් කිරීම.
11. iOS සඳහා DR යෙදුම සැලසුම් කිරීම.
12. Anti-Doping Education- The Athlete Learning Gateway on Anti-Doping (ALG on Anti-Doping) දැනුවත් කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස මෙම ක්‍රමය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට දැනුම පරීක්ෂා කිරීම සහ ඔවුන්ගේ ඉගෙනුම් මට්ටම සඳහා සහතිකයක් නිකුත් කිරීම සඳහා ගොඩනැඟෙනු ඇත.
13. ආයතනික යූ ටියුබ් වීඩියෝ නිර්මාණය කිරීම.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශය

ශේෂය	සටහන	2020 දෙසැම්බර් 31	2019 දෙසැම්බර් 31
		(ශ්‍රී ලංකා රුපියල්)	
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	1	225,864,722.09	208,530,974.49
ප්‍රාග්ධන ප්‍රගතිය	2	60,211,400.00	65,268,791.03
		286,076,122.09	**273,799,765.52**
ජංගම වත්කම්			
තොගය	3	1,805,639.63	2,018,589.00
අයවිය යුතු දෑ	4	691,040.00	-
මුදල් හා මුදල් හා සමාන දෑ	5	2,166,789.93	2,933,415.77
		4,663,469.56	**4,952,004.77**
මුළු වත්කම්		**290,739,591.65**	**278,751,770.29**
අරමුදල් හා වගකීම්			
මූල්‍යනය කළේ:			
භාණ්ඩාගාර ප්‍රතිපාදන	6	266,332,759.39	266,081,050.16
වෙනත් ප්‍රතිපාදන	7	2,198,212.88	2,951,335.38
සමුචිත අරමුදල	8.1	4,465,033.91	1,537,638.00
ප්‍රත්‍යාගණන සංචිතය	8.2	2,547,085.96	-
		275,543,092.14	**270,570,023.54**
ජංගම වගකීම්			
රඳවාගත් මුදල්	9	12,300,559.94	5,673,632.20
උපචිත වියදම්	10	1,194,630.66	764,928.17
ආපසු ගෙවියයුතු තැම්පතු		85,000.00	35,000.00
පාරිතෝෂික වෙන් කිරීම්	11	1,616,308.91	1,708,186.38
		15,196,499.51	**8,181,746.75**
		290,739,591.65	**278,751,770.29**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

.....
ඒ්‍ච්.ඒම්.සි.ජී.දායාරත්න
ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරණු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබමි.

.....
වෛද්‍ය සීවලී ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්

.....
මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	**සටහන**	**2020**	**2019**
		(ශ්‍රී ලංකා රුපියල්)	
භාණ්ඩාගාර ප්‍රතිපාදන	6	56,459,290.77	54,583,909.71
අමාත්‍යාංශ ප්‍රතිපාදන	7.4	753,122.50	625,975.00
වෙනත් ආදායම්	12	2,927,395.91	717,811.00
මුළු ආදායම්		60,139,809.18	55,927,695.71
පරිපාලන වියදම්	13	(57,212,413.27)	(55,209,884.71)
ශුද්ධ අතිරික්තය/(හිඟය)		**2,927,395.91**	**717,811.00**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
මූදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන්	2020	2019
		(ශ්‍රී ලංකා රුපියල්)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහයන්			
ශුද්ධ ලාභය		2,927,395.91	717,811.00
ගැලපීම්			
ක්ෂය		17,022,491.22	12,355,333.58
භාණ්ඩාගාර ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම්	6	(56,459,290.77)	(54,583,909.71)
		(36,509,403.64)	**(41,510,765.13)**
කාරක ප්‍රාග්ධන වෙනස් වීම්			
(වැඩි කිරීම්)/අඩු කිරීම් තොගය		212,949.37	(907,749.14)
(වැඩි කිරීම්)/අඩු කිරීම් අයවිය යුතු පරීක්ෂණ ගාස්තු		(691,040.00)	-
වැඩි කිරීම්/ (අඩු කිරීම්) යලි ගෙවන රැඳවුම් මුදල්		50,000.00	-
වැඩි කිරීම්/ (අඩු කිරීම්) පාරිතෝෂික වෙන් කිරීම්	11	(91,877.47)	270,191.10
වැඩි කිරීම්/(අඩු කිරීම්) රැඳවුම් මුදල්		6,626,927.74	(1,719,067.93)
වැඩි කිරීම්/(අඩු කිරීම්) උපචිත වියදම්		429,702.49	237,353.95
		6,536,662.13	**(2,119,272.02)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල්		**(29,972,741.51)**	**(43,630,037.15)**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහ			
දේපල පිරියත උපකරණ මිලදී ගැනීම්		(31,809,152.86)	(215,474,281.75)
කාරක ප්‍රාග්ධන ප්‍රගතිය		5,057,391.03	123,871,618.07
භාණ්ඩාගාර ප්‍රතිපාදන පියවීම		(15,000,000.00)	-
		(41,751,761.83)	**(91,602,663.68)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ			
භාණ්ඩාගාර ප්‍රතිපාදන		71,711,000.00	137,596,917.00
ලේකම් - ක්‍රීඩා අමාත්‍යාංශය		(753,122.50)	(625,975.00)
		70,957,877.50	**136,970,942.00**
වර්ෂය තුළදී මෙහෙයුම් තුළින් ජනිත වූ ශුද්ධ ලාභය (ප්‍රයෝජනයට ගන්නා ලද)		**(766,625.84)**	**1,738,241.17**
වර්ෂ ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		**2,933,415.77**	**1,195,174.60**
වර්ෂ අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		**2,166,789.93**	**2,933,415.77**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

(ශ්‍රී ලංකා රුපියල්)

	ප්‍රත්‍යාගණන සංචිතය රු.	සමුච්චිත ලාභය රු.	මුළු අගය රු.
2015 ජනවාරි 01 දිනට ශේෂය	-	110,540.00	110,540.00
වර්ෂයේ ශුද්ධ ලාභය	-	94,999.91	94,999.91
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	**205,539.91**	**205,539.91**
වර්ෂයේ ශුද්ධ ලාභය		155,063.00	155,063.00
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	**360,602.91**	**360,602.91**
වර්ෂයේ ශුද්ධ ලාභය	-	29,800.00	29,800.00
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	**390,402.91**	**390,402.91**
වර්ෂයේ ශුද්ධ ලාභය	-	429,424.00	429,424.00
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	**819,826.91**	**819,826.91**
වර්ෂයේ ශුද්ධ ලාභය	-	717,811.00	717,811.00
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	**1,537,637.91**	**1,537,637.91**
වර්ෂයේ ශුද්ධ ලාභය	-	2,927,395.91	- 2,927,395.91
ප්‍රත්‍යාගණන සංචිතය	2,547,085.96	-	2,547,085.96
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,547,085.96**	**4,465,033.82**	**7,012,119.78**

2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

1. වාර්ථා කිරීමේ ආස්ථිත්‍යය

1.1 පොදු

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2013 නොවැම්බර් මස 11 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද 2013 අංක 33 දරණ උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතට අනුව ස්ථාපිත කරන ලදී. මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය අංක 363/12, සුගතදාස ස්මේඩියම් - බ්ලොක් ඩී, ස්ටේඩියම් රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 යන ලිපිනයේ පිහිටුවා ඇත.

1.1 .**1 ආයතනයේ අරමුණු**

a) ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම

b) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර හා අදාළ පර්යේෂණ සහ නියෝජ්‍යායතනය සහ සමාන කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යොන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම

1.1.2. ප්‍රකාශණ අනුකූලතාවය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ ගිණුම් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය.

1.1.3. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ඓතිහාසික පිරවැය පදනම යටතේය. මෙහිදී උද්ධමනීය සාධක සැලකිල්ලට ගනු නොලබයි.

1.1.4. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

1.2. වත්කම් සහ අගය කිරීමේ පදනම

වර්ෂයක් තුළ මුදල් සහ බැංකු ශේෂය සහ මුදල් වලට පරිවර්ථනය කළ හැකි අයිතම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ශේෂ පත්‍රයේ විස්තර කර ඇත.

1.2.1 වත්කම්

දේපල පිරියත සහ උපකරණ වල අගය දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසුවය.

1.2.2 ක්ෂය

ක්ෂය ප්‍රතිපත්තිය සිදු කර ඇත්තේ සරළ මාර්ග ක්‍රමයටය. ක්ෂය කරනු ලබන්නේ වත්කම් අත්පත් කරගත් වර්ෂයේ සිට හෝ අදාළ වත්කමේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ වර්ෂයේ සිටය. වත්කමේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය තුළ ආදායම් සහ වියදම් ගිණුමෙන් ක්ෂය කපා හැරීම.

- පරිසණක සහ උපකරණ 25%
- ගෘහ උපකරණ 10%
- වෙනත් උපකරණ 25%

- මෝටර් වාහන 12.5%
- පර්යේෂණ උපකරණ 25%
- රසායනාගාර ගෘහ උපකරණ 10%
- ගොඩනැගිලි 5%

1.2.3 ප්‍රත්‍යාගණනය

සෑම වර්ෂ හතරකටම වරක් සුදුසුකම් සහිත පුද්ගලයින් විසින් පරිසණක සහ උපකරණ හා වෙනත් උපකරණ සඳහා ප්‍රත්‍යාගණනය සිදුකරනු ලබයි. ප්‍රත්‍යාගණන අතිරික්තය වත්කමෙහි දළ ධාරණ අගය මත හඳුනාගෙන එහි ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණන සංචිතයකට මාරු කරනු ලබයි

1.2.4 තොග

වසර අවසාන තොගය ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 9, ඡේද 16 ට අනුකූලව තක්සේරු කර ඇති අතර,හුවමාරු නොවන ගනුදෙනුවක් මාර්ගයෙන් තොග අත්පත් කරගත් අවස්තාවලදී ඒවායේ පිරිවැය ඒවා අත්පත් කරගත් දින පැවති සාධාරණ අගයට මනිනු ලැබේ. තොගවල සාධාරණ අගය/ ගැනුම් පිරිවැය (අ) ගැනුම් මිල, (ආ) ආනයන තීරු බදු සහ අනෙකුත් බදු සහ (ඇ) ප්‍රවාහන වියදම් හා පරිහරණ ගාස්තු සහ නිම් භාණ්ඩ අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාල වන අනෙකුත් පිරිවැය වලින් සමන්විතවේ. ආයතනයේ තොග පහත පරිදි වේ.

- මානව සාම්පල් කට්ටල
- අශ්ව සාම්පල් කට්ටල
- මානව රුධිර සාම්පල් කට්ටල
- ලිපිද්‍රව්‍ය

1.3. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගත් සියළුම වගකීම් ගිණුම්ගත කර ඇත.ශේෂපත්‍ර දින සිට වර්ෂයක් තුළ ගෙවිය හැකි හෝ ඉල්ලීමක් මත ගෙවිය හැකි වගකීම් ජංගම වගකීම් ලෙස ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇත.ගෙවීම සඳහා වර්ෂයකට වැඩි කාලයක් ගත වන වගකීම් ජංගම නොවන වගකීම් වේ.

1.3.1 සේවකයන්ගේ හිමිකම්.

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවා නියුකිතිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා දායකත්වය මූල්‍ය ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

1.3.2. සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂිත

සෑම සේවකයෙකු සේවයෙහි යෙදී පළමු වර්ෂය අවසන් වූ පසුව විශ්‍රාම පාරිතෝෂික වෙන් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව මෙය සිදු කරනු ලබයි. සෑම වර්ෂයකම දෙසැම්බර් මස අවසාන දිනට ඇති කාර්යය මණ්ඩලයේ දළ වැටුපෙන් භාගයක් පාරිතෝෂිත සඳහා වෙන් කරනු ලබයි. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව මෙම ගෙවීම සිදු කරනු ලබන්නේ වසර 5 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කරන ලද සේවකයින්ට පමණි.

1.4.ආදායම් ප්‍රකාශය

1.4.1 ආදායම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය අදාළ සේවාව ලබා දීමෙන් පසුව උපචිත පදනම මත ආදායම හඳුනාගනී.

1.4.2 වියදම්

වියදම් පිළිබඳ විස්තරයෙහි ලාභය හෝ අලාභය හඳුනාගන්නේ බදු අයකිරීමට පෙර හා හඳුනාගත් සියළු වගකීම් සඳහා වෙන්කිරීමෙන් පසුවය.

වත්කම් නඩත්තු කිරීමේ හා ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී දැරීමට වන වියදම් ශුද්ධ ඌනතාවය හෝ අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම් පිළිබඳ විස්තර වල ගලපනු ඇත.

දුරකතන වියදම්, විදුලි වියදම් හා ජල බිල්පත් එම පහසුකම් සඳහා හිමිකම් කියන නිළධාරීන් හා සේවකයන්ගෙන් අයකරනු ලබයි. එම වියදම් අදාල තීරු හි විස්තර කරනු ලබයි.

1.4.3 ප්‍රතිපාදන

ප්‍රතිපාදන හා ආධාර අදාල වියදම් සඳහා ගැලපෙන අයුරින් සකස් කර ඇත. වත්කම් හා සම්බන්ධ මූල්‍ය නොවන ප්‍රතිපාදන, මූල්‍ය වටිනාකම මත ගිණුම්ගත කල යුතු අතර එම වත්කම් ආදායම් ප්‍රකාශයේ වත්කමේ ඵලදායි ජීව කාලය තුල කපා හරිනු ඇත.

1.4.4 අනෙකුත් ප්‍රතිපාදන

වෙනත් ප්‍රදාන සහ ආධාර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස ගිණුම්ගත කල යුතු අතර, වැඩසටහන අවසානයේ ඇති යම් මුදලක් තිබේ නම්, එය වෙනත් ආදායමක් ලෙස ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

- අමාත්‍යාංශ ප්‍රතිපාදන

1.5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.5.1 මුදල්

අතැති මුදල් හා ඉහළ ද්‍රවශීලතාවක් සහිත කිසිදු අවධානමකින් තොරව පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි වත්කම් මුදල් ලෙස හඳුනා ගනී. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය මත අතැති මුදල් හා බැංකු මුදල්, මුදල් ලෙස හඳුනා ගැනේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනුයේ වක්‍ර පදනමටය.

1.5.2. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2020 දෙසැම්බර් **31** න් අවසන් වර්ෂය සඳහා
සටහන **01**
දේපල පිරියත සහ උපකරණ
(ශ්‍රී ලංකා රුපියල්**)**

පිරිවැය/ ප්‍රත්‍යාගණිත	**2020.01.01** දිනට ශේෂය	ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම්	ප්‍රත්‍යාගණන ගැලපීම	**2020.12.31** දිනට ශේෂය
ගොඩනැගිලි සහ සැලසුම්	212,942,054.30	3,736,768.65	-	216,678,822.95
ගෘහ භාණ්ඩ	873,436.35	-	-	873,436.35
පරිඝණක සහ උපකරණ	3,087,537.00	71,370.00	1,903,057.00	1,255,850.00
වෙනත් උපකරණ	2,657,312.00	148,685.66	476,347.66	2,329,650.00
රථ වාහන -WPLW - 0353	6,024,980.00	-	-	6,024,980.00
පර්යේෂණ උපකරණ	179,928.00	10,975,914.25	-	11,155,842.25
රසායනාගාර ගෘහ උපකරණ	-	16,876,414.30	-	16,876,414.30
	225,765,247.65	**31,809,152.86**	**2,379,404.66**	**255,194,995.85**

සමුච්චිත ක්ෂය	**2020.01.01** දිනට ශේෂය	ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම්	ප්‍රත්‍යාගණන ගැලපීම	**2020.12.31** දිනට ශේෂය
ගොඩනැගිලි සහ සැලසුම්	10,647,102.72	10,833,941.15	-	21,481,043.86
ගෘහ භාණ්ඩ	352,776.36	165,952.92	-	518,729.28
පරිඝණක සහ උපකරණ	2,893,260.50	138,835.00	3,032,095.50	-
වෙනත් උපකරණ	1,240,357.45	654,037.67	1,894,395.12	-
රථ වාහන -WPLW - 0353	2,010,812.13	753,122.50	-	2,763,934.63
පර්යේෂණ උපකරණ	89,964.00	2,788,960.56	-	2,878,924.56
රසායනාගාර ගෘහ උපකරණ	-	1,687,641.43	-	1,687,641.43
	17,234,273.16	**17,022,491.22**	**4,926,490.62**	**29,330,273.76**
2020/12/31 දිනට ලේඛණගත අගය	**208,530,974.49**	**14,786,661.65**	**(2,547,085.96)**	**225,864,722.09**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

සටහන 02

	(ශ්‍රී ලංකා රුපියල්)	
කාරක ප්‍රාග්ධන ප්‍රගතිය	**2020**	**2019**
පර්යේෂණ උපකරණ	60,211,400.00	50,932,900.00
රසායනාගාර ගෘහ උපකරණ	-	14,335,891.03
	60,211,400.00	**65,268,791.03**

කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම යටතට ගෙන ඇති ගොඩනැගිලි ඉදිකිරීම් වියදම මගින් ප්‍රාග්ධන වියදමෙහි ප්‍රගතිය නිරූපනය කරනු ලබයි. කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු 2020/01/01 වන විට නිම කර තිබුණි.ප්‍රාග්ධන වියදමෙහි ප්‍රගතිය අදාළ වත්කම් ගිණුමට මාරු කර ඇත.

සටහන 03
තොග

අවසන් තොගය - මානව සාම්පල් කට්ටල	1,054,576.13	1,664,253.00
අවසන් තොගය - අශ්ව සාම්පල් කට්ටල	115,710.00	121,800.00
අවසන් තොගය - රුධිර සාම්පල් කට්ටල	-	232,536.00
අවසන් තොගය - ලිපිද්‍රව්‍ය	635,353.50	-
	1,805,639.63	**2,018,589.00**

සටහන 04
10. අයවියයුතු දෑ

පරීක්ෂණ ආදායම් - ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය	691,040.00	-
	691,040.00	-

සටහන 05
මුදල් සහ මුදල් හා සමාන දෑ

ලංකා බැංකුව - ගිණුම් අංක 75463697	2,166,789.93	2,933,415.77
	2,166,789.93	**2,933,415.77**

සටහන 06
භාණ්ඩාගාර ප්‍රතිපාදන

2020.01.01 දිනට ශේෂය	266,081,050.16	183,068,042.87
ගලා ඒම් -2020	71,711,000.00	137,596,917.00
අරමුදල් ක්‍රමක්ෂය 2020	(56,459,290.77)	(54,583,909.71)
භාණ්ඩාගාරට පියවීම	(15,000,000.00)	-
2020.12.31 දිනට ශේෂය	**266,332,759.39**	**266,081,050.16**

සටහන 07
7. වෙනත් ප්‍රතිපාදන
7.4 අමාත්‍යාංශ ප්‍රතිපාදන

2020.01.01 දිනට ශේෂය	2,951,335.38	3,577,310.38
2020 අරමුදල් ක්‍රමක්ෂය	(753,122.50)	(625,975.00)
2020.12.31 දිනට ශේෂය	**2,198,212.88**	**2,951,335.38**

7.5 අරමුදල් සාරාංශය

2020.01.01 දිනට ශේෂය	2,951,335.38	3,577,310.38
2020 අරමුදල් ක්‍රමක්ෂය	(753,122.50)	(625,975.00)
2020.12.31 දිනට ශේෂය	**2,198,212.88**	**2,951,335.38**

සටහන 08

8.1 උපචිත අරමුදල්

ආරම්භක වර්ෂයේ ශේෂය	1,537,638.00	819,827.00
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලාභය මාරු කිරීම	2,927,395.91	717,811.00
වර්ෂ අවසානයේ ශේෂය	**4,465,033.91**	**1,537,638.00**

8.2 ප්‍රත්‍යාගණන සංචිත

ප්‍රත්‍යාගණන සංචිත	2,547,085.96	-
වර්ෂ අවසානයේ ශේෂය	**2,547,085.96**	-

සටහන 09

රැඳවුම් ගිණුම්

ජෝර්ජ් ස්ටුවර්ට් ඉංජිනියරින් (පුද්) සමාගම	2,549,144.14	5,098,288.28
ඇනලටිකල් ඉන්ස්ටෘමන්ට්ස්	472,915.80	575,343.92
හේලීස් ලයිෆ් සයන්ස් (පුද්) සමාගම	9,278,500.00	-
	12,300,559.94	**5,673,632.20**

සටහන 10

උපචිත වියදම්

තැපල් සහ සන්නිවේදන	83,003.78	28,789.76
විදුලිය සහ ජල වියදම්	170,091.90	132,734.40
මෙහෙයුම් කල්බදු - ලීසිං කුලිය	216,000.00	216,000.00
වැටුප් හා වේතන	5,000.00	8,000.00
අතිකාල දීමනා වියදම්	74,798.55	25,946.21
ප්‍රවාහන වියදම්	151,220.00	-
ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය	-	1,340.00
ආරක්ෂක සේවා	190,814.00	166,185.00
පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා	23,147.73	185,932.80
විගණන ගාස්තු	117,600.00	-
තහනම් උත්තේජක පරීක්ෂණ වියදම්	162,954.70	-
	1,194,630.66	**764,928.17**

සටහන 11

පාරිතෝෂික වෙන් කිරීම්

	1,708,186.38	1,437,995.39
වසර සඳහා පාරිතෝෂික ගෙවීම	(103,337.50)	-
වර්ෂයේ වෙන් කිරීම	11,460.03	270,190.99
වර්ෂ අවසානයේ වෙන් කිරීම	**1,616,308.91**	**1,708,186.38**

සටහන 12

වෙනත් ආදායම්		
උත්තේජක පරීක්ෂණ ආදායම්	2,738,253.71	667,811.00
යලි නොගෙවන තැම්පතු	19,000.00	50,000.00
කුලී ආදායම්	67,500.00	-
වෙනත් ආදායම්	102,642.20	-
	2,927,395.91	**717,811.00**

සටහන 13

පරිපාලන වියදම්		
වැටුප් හා වේතන	10,470,508.38	10,334,921.57
සභාපතිතුමාගේ දීමනා	409,913.79	412,500.00
අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	442,697.25	493,966.00
සේවක අර්ථසාධක අරමුදල	1,223,474.93	1,202,143.73
සේවක නියුක්තිකයේ භාරකාර අරමුදල	305,868.73	301,751.28
ගෘහස්ථ, ප්‍රවාහන සහ ඉන්ධන දීමනා	600,000.00	695,000.00
විදේශීය ගමන් වියදම්	21,860.00	1,116,591.64
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල උපකරණ	(207,694.49)	451,227.17
ඉන්ධන	821,863.00	845,824.00
වාහන නඩත්තු වියදම්	195,112.21	708,193.78
ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම්	357,918.00	112,878.28
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	637,902.28	218,387.48
ප්‍රවාහන	1,115,445.00	1,131,975.50
මෙහෙයුම් කල්බදු සඳහා ගෙවීම්	2,592,000.00	2,746,000.00
තැපැල් සහ සන්නිවේදන	907,068.69	670,032.53
විදුලිය සහ ජලය	1,802,086.45	1,816,335.67
තහනම් උත්තේජක පරීක්ෂණ ගාස්තු	11,521,640.07	9,482,020.40
ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය	982,448.00	1,344,760.38
පුහුණු සහ රැස්වීම් වියදම්	679,034.00	1,692,122.47
WADA,iNADO සාමාජිකත්වය අළුත් කර ගැනීමේ වියදම්	304,688.80	2,362,123.51
විගණන ගාස්තු	512,880.00	-
අලෙවිකරණ සහ පර්යේෂණ වියදම්	464,780.92	71,270.00
දැනුවත් කිරීමේ වැඩමුළු	510,541.36	45,617.00
ධාරිතාව වර්ධන	91,350.00	603,023.00
ක්ෂය වීම්	17,022,491.22	12,355,333.58
පාරිතෝෂික වෙන් කිරීම්	11,460.03	270,190.99
පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා	1,334,770.65	2,025,854.75
ආරක්ෂක සේවා	2,080,304.00	1,699,840.00
	57,212,413.27	**55,209,884.71**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එස්වයිඒ/ඒ/එස්එල්ඒඩිඒ/06/20/06

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 දෙසැම්බර් 24 දින

සභාපති
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 30 වගන්තිය සහ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර්31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන නියෝජ්‍යායතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

නියෝජ්‍යායතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියෝජ්‍යායතනයේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා නියෝජ්‍යායතනයේ පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට නියෝජ්‍යායතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණය
මුදල් රෙගුලාසි 371(2)	තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම එම තත්කාර්යය අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද ආයතනය විසින් අවස්ථා 09 කදී ලබා දුන් එකතුව රු.237,400 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 34 සිට දින 75 දක්වා ප්‍රමාදවීම් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) තහනම් උත්තේජක පරීක්ෂණ තීව්‍ර කිරීම, වැඩි ක්‍රීඩා ප්‍රමාණයක් ආවරණය වන ලෙස තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම හා තහනම් ද්‍රව්‍ය භාවිතයේ ඇති විපාක පිලිබඳ ක්‍රීඩා ප්‍රජාවේ දැනුවත් භාවය වැඩි කිරීමේ ප්‍රගතිය සියයට 0 සිට සියයට 49 දක්වා වන බව හා සම්ප්‍රදායික දේශීය ආහාර පාන, ඖෂධ හි තහනම් සංඝටක පිළිබඳ පර්යේෂණ කිරීම හා තොරතුරු යාවත්කාලීන කර ගැනීමේ ප්‍රගතිය සියයට 75 සිට සියයට 100 දක්වා පැවතුණි.

(ආ) නියෝජ්‍යායතනයේ 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 28 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 19 ක් වූ අතර පුරප්පාඩු සේවක සංඛ්‍යාව 09 ක් විය. නියෝජ්‍යායතනයේ පැවති අධ්‍යාපන හා පරීක්ෂණ සහ ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීමේ අංශ 02 ක පවතින අධ්‍යක්ෂ තනතුරු හා සහකාර අධ්‍යක්ෂ තනතුරු 2014 වර්ෂයේ සිට පුරප්පාඩු 04 ක් පැවතීම ආයතනයේ කාර්යසාධනයට සෘජුව බලපෑ හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුළ නොනිමී ප්‍රාග්ධන වැඩවල පර්යේෂණ උපකරණ යටතේ රු. 60,211,400 ක් පැවති අතර මෙම පර්යේෂණ උපකරණ 2020 අප්‍රේල් 05 දින වන විට ස්ථාපිත කර නිම කළ යුතුව පැවතුණි. 2020 මාර්තු 15 දින වන විට මෙම උපකරණ නියෝජ්‍යායතනය වෙත ලැබී තිබුණ අතර, යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පුහුණු කිරීම් හා යන්ත්‍ර භාවිතා කිරීමට අවශ්‍ය පරීක්ෂණ කටයුතු සඳහා විශේෂඥ සේවා ලබා ගැනීමට අදාළව අවස්ථා කිහිපයකදීම ලිපි යැවීම්, මාර්ගගත (Online) ක්‍රම යටතේ පුහුණුව ලබා ගැනීමට හා ඊට අදාළ සාකච්ඡා පැවැත්වීමට කටයුතු කර තිබුණද එම පුහුණුවීම් කටයුතු නිමකර නොතිබීම හේතුවෙන් එම උපකරණ භාවිතයට ගැනීම 2021 නොවැම්බර් 16 දින වන විටත් නොහැකි වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති